සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# ඉස්ලාම් ධර්මය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 දේව ප්‍රතික්ෂේප (කුෆ්ර්) කරන්නවුන්ගෙන් මුස්ලිම්වරයකු වෙන්කර පෙන්වන නැමදුම

(i) උපවාසය (ii) සලාතය (iii) සකාත් (iv) හජ්

02 ඉස්ලාමීය වගකීම් අතරින් මුල්ම වගකීම

(i) සලාතය (ii) සකාත් (iii) ෂහාදා (iv) හජ්

03 මුල්ම සූර් පිඹීමෙන් අනතුරුව සිදුවන සිදුවීමකි

(i) පරීක්ෂණය (ii) ස්වර්ගය හෝ අපායට යෑම

(iii) එකට එකතු කිරීම (iv) ලෝක විනාශය සිදුවීම

04 කුසල්, අකුසල් ලියාපදිංචි කිරීමේ මලාඉකාවරුන්

(i) ජිබ්රීල් (අලෛ), මීකායින් (අලෛ) (ii) මාලික් (අලෛ), රිල්වාන් (අලෛ)

(iii) මුන්කර් (අලෛ), නකීර් (අලෛ) (iv) රකිබ් (අලෛ), අතීද් (අලෛ)

05 කන්දෙක ''මසහ්'' කිරීම

(i) ෆර්ල් (ii) සුන්නත් (iii) මුබ්තිලාත් (iv) වාජිබ්

06 වුළූහි ෆර්ල්

(i) 19 (ii) 5 (iii) 6 (iv) 10

07 බල්ලාගේ හා ඌරාගේ කෙල

(i) දැඩි නජීස් ය. (ii) සාමාන්‍ය නජීස් ය.

(iii) සැහැල්ලු නජීස් ය. (iv) අපිරිසිදු නජීස් ය.

08 ''අල්ලාහු හාලිකුනා'' යන්නෙහි අර්ථය

(i) පාරිශුද්ධ ස්වාමියා ය. (ii) අල්ලාහ් යහමග පෙන්වන්නා ය.

(iii) අල්ලාහ් අපට ආහාර ලබාදෙන්නා ය. (iv) අල්ලාහ් අපව නිර්මාණය කළ කෙනාය.

09 ''මාඋන් තාහිර්'' පිරිසිදු ජලය සඳහා උදාහරණ

(i) මුහුදු ජලය (ii) කුරුම්බා වතුර (iii) වැහි වතුර (iv) ළිං වතුර

10 ''නජීස්'' හි ප්‍රධාන කොටස්

(i) 3 (ii) 5 (iii) 2 (iv) 6

11 පොහොසත් අය පමණක් ඉටුකළ යුතු ඉස්ලාමීය වගකීම්

(i) ෂහාදා, සලාතය (ii) උපවාසය, සකාත්

(iii) සකාත්, සලාතය (iv) හජ්, සකාත්

12 සලාතය ඉටු නොකරන්නා ඇතුළුවන අපාය

(i) හාවියා (ii) සකර් (iii) ජහන්නම් (iv) හුතමා

13 මරණයෙන් මතු ජීවිතයේ දී ''හුර්රන් මුහජ්ජලීන්'' ලෙස ආමන්ත්‍රණයට ලක්වන්නෝ

(i) පංචකාල සලාතය දිගටම ඉටුකළ අය

(ii) නිවැරදිව සකාත් දුන් අය

(iii) උපවාසයේ නියලුන අය

(iv) වුළූහි අවයවයන් දීප්තිමත්ව තිබෙන අය

14 වුළූ කඩවන කාර්යයක් වන්නේ,

(i) ක්ලාන්තය (ii) දත් මැදීම (iii) ආහාර ගැනීම (iv) කතා කිරීම

15 මුස්ලිම්වරයකු පංචකාල සලාතය ඉටුකිරීමට උචිත ආරම්භක වයස් සීමාව

(i) 10 (ii) 12 (iii) 7 (iv) 5

- **පහත සඳහන් කියමන් නිවැරදි නම් (✓) සලකුණ ද, වැරදි නම් වැරදි (✗) සලකුණ ද යොදන්න.**

16 විශ්ව නිර්මාණයන් සියල්ල අල්ලාහ්ගේ මහිමයන් මතක් කරවති. ( )

17 අප ඊමාන් කළ යුතු කාරණයන්ගෙන් පස්වන කරුණ වන්නේ ''කද්ර්'' සම්බන්ධවයි. ( )

18 අල්ලාහ් ආදම් (අලෛ) තුමාගේ ඉල ඇටයෙන් හව්වා තුමිය මැව්වේ ය. ( )

19 ජින්වරුන් ආලෝකයෙන් මවා ඇත. ( )

20 තනිව සලාතය ඉටුකරනවාට වඩා සාමූහිකව ඉටුකිරීම 27 ගුණයක් වැඩිය. ( )

**6 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) ''ආමන්තු බිල්ලාහ්'' යන්නෙහි තේරුම ලියන්න.

(ii) ''ඉස්ලාම්'' යන අරාබි පදයට අයත් තේරුම් දෙකක් ලියන්න.

(iii) ''ජිබ්රීල් (අලෛ)'' තුමාගේ ශ්‍රේෂ්ඨ නම් දෙකක් ලියන්න.

(iv) ''ලේ'' කුමන නජීස් වර්ගයක් ද?

(v) ''තහාරත්'' යන වචනයෙහි අර්ථය කුමක් ද?

(vi) සැහැල්ලු නජීසය සඳහා උදාහරණ 2 ක් දෙන්න.

(vii) අප ඉටුකරන පංචකාල සලාතයෙහි සම්පූර්ණ රක්අත් ගණන කීයද?

(viii) ''තව්හීද්'' නැමති වචනයෙහි තෙරුම සඳහන් කරන්න.

(ix) ''ස්වර්ගයේ යතුර'' යනුවෙන් නබි සල් තුමාණන් වර්ණනා කළ නැමදුම කුමක් ද?

(x) පිරිසිදුකමෙහි වර්ග සඳහන් කරන්න. (2 x10 = 20)

02 (i) අල්ලාහ්ගේ නිර්මාණයන් දෙකක් සඳහන් කරන්න.

(ii) අවසන් ආගමෙන් පිදුම් පද නබි කව්ද?

(iii) ඊමාන් කළයුතු කාරණයන් අනුපිළිවෙලට ලියන්න. (ලකුණු 10)

03 (i) දෙවන සූර් පිඹින විට සිදුවන සිදුවීම් දෙකක් ලියන්න.

(ii) ඊමාන්හි ප්‍රධාන කාර්යයන් තුනක් සඳහන් කරන්න.

(iii) අර්කානුල් ඉස්ලාම්හි අන්තර්ගත දෑ පිළිවෙලට ලියන්න. (ලකුණු 10)

04 (i) ආදම් (අලෛ) තුමා කුමකින් මවනු ලද්දේ ද?

(ii) මලාඉකාවරුන්ගේ ගුණාංග තුනක් සඳහන් කරන්න.

(iii) ප්‍රධාන මලාඉකාවරුන් පස්දෙනෙකුගේ සේවයන් ලියන්න. (ලකුණු 10)

05 (i) පිරිසිදුකම ගැන හදීසයක් ලියන්න.

(ii) ජලයෙහි ප්‍රධාන වර්ග උදාහරණයක් සමග ලියන්න.

(iii) වුළූහි ෆර්ල් දෙකක් ලියන්න. (ලකුණු 10)

06 (i) සලාතය ඉටුකිරීම තුළින් ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

(ii) වුලූ කඩවන කාරණයන් තුනක් සඳහන් කරන්න.

(iii) සලාතයේ ෂර්ත් 5 ක් ලියන්න. (ලකුණු 10)

07 (i) මනස පවිත්‍ර කරන හොඳ කුසල් 2 ක් ලියන්න.

(ii) වුළූහි සුන්නත් 3 ක් ලියන්න.

(iii) සලාතයේ ෆර්ල් 5 ක් ලියන්න. (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| (01) 2 | (02) 3 | (03) 4 | (04) 4 | (05) 2 | (06) 1 | (07) 1 | (08) 4 | (09) 2 |
| (10) 1 | (11) 1 | (12) 2 | (13) 4 | (14) 1 | (15) 3 | (16) ✓ | (17) ✗ | (18) ✓ |
| (19) ✗ | (20) ✓ | | | | | | | |

## II කොටස

01 (i) මම දෙවියන් විශ්වාස කළෙමි / කරමි (ii) සාන්තිය, සමාදානය, අවනත වීම, කීකරු වීම

(iii) අර්රූහ්, නාමුසුල්, අෑළම්, රූහුල්, කුදුස් (iv) සැහැල්ලු නජීස්

(v) පිරිසිදුකම (vi) මව් කිරි පමණක් ආහාර ලෙස ගන්නා අවුරුදු 2 ක් තුළ ඉන්නා පිරිමි (පුරුෂ) ළමුන්

(vii) 17 (viii) ඒකීය දේවවාදය

(ix) සලාතය (x) අභ්‍යන්තර පිරිසිදුකම, භාහිර පිරිසිදුකම

02 (i) අහස, පොළොව, කඳු, මිනිසා හා ජීවීන්

(ii) මුහම්මද් නබි (සල්) තුමාණන්

(iii) අල්ලාහ් විශ්වාස කිරීම, ඔහුගේ මලාඉකාවරුන් විශ්වාස කිරීම, පාරිශුද්ධ ග්‍රන්ථ විශ්වාස කිරීම, රසූල්වරුන් විශ්වාස කිරී, මරණයෙන් මතු ජීවිතය විශ්වාස කිරීම, කද්ර්

03 (i) මිනිසුන් ජීවන ලබාදී නැගිටවනු ලබන්නෝ ය. / මහ්ෂර්හි ඒකරාසි කරනු ලබන්නෝ ය. / විනිශ්චය සිදුවේ / අකුසල් කළ අය නිරයට (අපායට) / කුසල් කළ අය ස්වර්ලයටත් පිවිසෙයි.

(ii) තව්හීද්, රිසාලත්, මආද්

(iii) ෂහාදා, සලාතය, සකාත්, උපවාසය, හජ්

04 (i) පසෙන්

(ii) ආලෝකයෙන් මවන ලද්දෝ ය / ආශාවන් රහිතය / අල්ලාහ්ගේ අණ කඩකරන්නැති අය / ස්ව හැඩරුවෙන් ඔවුන්ව දකින්නට නොහැකිය / පුරුෂ අයත් නොව / ස්ත්‍රී අයත් නොව / දෙමාපියන් හෝ දූ දරුවන් නැහැ / ලිහිල් කිරීම්, බිය, මහන්සිය, විඩාව, නින්ද යනාදිය සිදුනොවේ.

(iii) ජිබ්රීල් (අලෛ) - වහී
මිකායිල් (අලෛ) - සුළඟ, වැස්ස, ගින්දර
ඉස්රාෆීල් (අලෛ) - මරණය පිඹීම
ඉස්රායිල් (අලෛ) - ජීවය අත්පත් කර ගැනීම
රකීබ්, අතීද් (අලෛ) - කුසල්, අකුසල්
මුන්කර්, නකීර් (අලෛ) - කබ්ර් හි විනිශ්චය
මාලික් (අලෛ) - නිරයේ අධිපති
රිළ්වාන් (අලෛ) - ස්වර්ගයේ අධිපති

05 (i) ''පිරිසිදුකම ඊමානයෙහි අඩකි''

(ii) මාඋන් තහූර් - පාරිශුද්ධ ජලය (ගඟ, වැව, වැස්ස, මුහුද)
මාඋන් තාහිර් - කුණු ජලය, මුත්‍රා, මධ්‍යසාර

(iii) නියියත්, මුහුණ සම්පූර්ණයෙන් සේදීම, දෙඅත් සම්පූර්ණයෙන් සේදීම, හිස මසහ් කිරීම, දෙපා විලුඹතෙක් සේදීම, පිළිවෙලට කිරීම

06 (i) පව් ක්ෂමාකරණු ලබයි / ස්වර්ගයට ප්‍රවේශ විය හැක / අප අවශ්‍යතාවයන් දෙවියන්ගෙන් ඍජුව ඉල්ලීමට අවස්ථාවක් ලැබීම / දීප්තිමත්ව හා සාක්ෂි වශයෙන් පිහිටයි / එලොව ජීවිතයේ දී ජයග්‍රහණය ගෙනදේවි / සිත, කය නිරෝගීකම ලබාදේ

(ii) පෙර, පසු සිදුරුවලින් කුමක් හෝ / යම් දෙයක් පිටවීම
බුද්ධිය දුරුවීම (ක්ලාන්තය, නින්ද, බීමත්)
අජ්නබි ස්ත්‍රියක් පුරුෂයකු හෝ පිරිමි කෙනෙකු ස්ත්‍රියකු හෝ ස්පර්ශ කිරීම.
කිසිම අව්රතයක් නොමැතිව රහස් පෙදෙස් ස්පර්ශ කිරීම.

(iii) මුස්ලිම් වීම / තමීස් (කල වයස) ලැබ සිටීම / පිරිසිදුව සිටීම / වස්ත්‍ර, ශරීරය, නමදින ස්ථානය යනාදිය පිරිසිදුව තිබීම / අව්රත් වසා තිබීම / කිබ්ලා දෙසට මුහුණලා සිටීම / සලාතය තමන්ට අනිවාර්යය වගකීම බව දැන සිටීම / සලාතයේ නිසි වේලාව එළඹ තිබීම / සලාත් ක්‍රමය දැන සිටීම / ෆර්ල්, ෆර්ල් ලෙසත් / සුන්නත්, සුන්නත් ලෙසත් සැන සිටීම

07 (i) අල් කුර්ආන් පාරායනය කිරීම / දික්ර් කිරීම / තස්බීහ් කිරීම / පව් ක්‍ෂමා ඉල්ලීම / සලවාත් පැවසීම

(ii) කිබ්ලා මුහුණලා සිටීම / බිස්මිල් පැවසීම / මිස්වාක් කිරීම / මුඛ සේදීම හා නාසයට වතුර යෙදීම / දෙඅත් මැණික් කටුව තෙක් සේදීම / දකුණු පැති අවයව පෙර භාවිතා කිරීම / මසහ් කිරීම / සෑම අවයවයක්ම සේදීම / වුළූහි දුආ ප්‍රාර්ථනාව ඉල්ලීම

(iii) සලාතයෙහි ෆර්ල් 19 න් කුමක් හෝ 5 ක් ලියා ඇත්නම්